# දළ දේශීය නිෂ්පාදිතය
## 2023 වර්ෂයේ දෙවන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය
පදනම් වර්ෂය 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ දෙවන කාර්තුව ( අප්‍රේල් 1 සිට ජූනි 30 දක්වා) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 6,145,452 ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,597,440 ක් ලෙස වාර්තා වේ. 2022 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 5,442,362 ක් සහ රුපියල් මිලියන 2,680,074 ක් වශයෙන් වාර්තා වී තිබුණි.

- 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 3.1 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙම වර්ධනය සටහන් වුයේ සියයට 7.4 ක සෘණ වර්ධනයක් වශයෙනි.
- 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 3.6 වර්ධනයක් වාර්තා කර ඇති අතර කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 11.5 ක්, සියයට 0.8 ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.
- 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 10.4 ක්, සියයට 27.0 ක්, සියයට 56.8 ක් සහ සියයට 5.8 ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

**අන්තර්ගතය**

2023 දෙවන කාර්තුවේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2023 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2023 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන වේගය සියයට 3.1ක පසුබැසීමක් ලෙස වාර්තා වී ඇති බවයි.

ඒ අනුව, 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,680,074 ක් ලෙස වාර්තා වූ අතර එය 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 2,597,440 ක් දක්වා අඩු වී ඇත.

තව ද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 5,442,362 ක් ලෙස වාර්තා වූ අතර එය 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 6,145,452 ක් දක්වා සියයට 12.9 කින් වැඩිවී ඇත.

රූපසටහන 01
ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය - 2022 සහ 2023 දෙවන කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 10.4 ක්, සියයට 27.0 ක්, සියයට 56.8 ක් වශයෙන් වේ. තව ද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 5.8 ක් ලෙස වාර්තා වේ.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 3.6 වර්ධනයක් වාර්තා කර ඇති අතර කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 11.5 ක්, සියයට 0.8 ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ වැඩි කාලයක් පුරා ආර්ථිකය තුළ ඉහළ පොළී අනුපාතික මගින් කෙටි සහ දිගුකාලීන ආයෝජන මත ඇති කරන ලද පීඩනය තවදුරටත් බලාත්මකව පැවති අතර ජනතාවගේ මූර්ත ආදායම් අඩුවීමෙන් පරිභෝජන රටාව එදිනෙදා පරිභෝජනය කරන භාණ්ඩ වටා කේන්ද්‍රගත වීමක් දැකිය හැකි විය. සමස්තයක් වශයෙන් ආර්ථිකය පිළිබඳ අපේක්ෂා තවදුරටත් පහළ මට්ටමක මන්දගාමීව වර්ධනය වෙමින් පැවති අතර ඒ සඳහා විශේෂයෙන් විනිමය අනුපාතිකය සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිත තත්ත්වය බලපාන ලදි. තව ද දේශීය වශයෙන් යෙදවුම් පිරිවැය

ඉහළ මට්ටමක පැවතීම අපනයන සම්බන්ධයෙන් අන්තර්ජාතික තරගකාරීත්වය පිරිහීමට හේතු වී ඇති අතර අපනයන පරිමාවේ අඩුවීමක් දෙවන කාර්තුවේ දී නිරීක්ෂණය කළ හැකි විය.

මෙකී බලපෑම් හේතුවෙන් 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී නිෂ්පාදන කර්මාන්ත කටයුතු, ඉදිකිරීම් කර්මාන්ත කටයුතු, පතල් හා කැනීම් කර්මාන්ත කටයුතු සැලකිය යුතු පසුබෑසීම් වාර්තා කර ඇති අතර මූල්‍ය සේවා සැපයීම් ඍණ වර්ධනයක් වාර්තා කර ඇත. එසේම තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සැපයීම් සහ වෘත්තීය සේවා තවදුරටත් පසුබෑසීම් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 3.6 ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී 'ධාන්‍ය වගා කිරීම' (සියයට 44.4), 'පැළ බෝකිරීම' (සියයට 19.5), 'වී වගා කිරීම' (සියයට 19.8), කෘෂිකාර්මික සහය සේවා කටයුතු (සියයට 13.2), 'තේ වගා කිරීම' (සියයට 7.1), 'එළවළු වගා කිරීම' (සියයට 6.9), 'රබර් වගා කිරීම' (සියයට 5.8), 'කුළු බඩු වගා කිරීම' (සියයට 5.1), 'පළතුරු වගා කිරීම' (සියයට 3.8), 'කරදිය ධීවර කටයුතු' (සියයට 1.3) සහ 'සත්ව නිෂ්පාදන කටයුතු' (සියයට 0.6) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කරමින් ඊට දායක වී ඇත. කෙසේ වෙතත් සමහර ප්‍රධාන කෘෂිකාර්මික ආර්ථික කටයුතු ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදි 'මිරිදිය ධිවර කටයුතු (සියයට 14.0), වන වගා සහ දැව කඳන් නිෂ්පාදනය' (සියයට 11.6), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 8.4) වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 11.5 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. එහිදි 'ඉදිකිරීම් කර්මාන්තය' සහ 'පතල් හා කැනීම් කර්මාන්තය' පිළිවෙලින් සියයට 23.1 ක් සහ සියයට 24.3 ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 5.1 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර ඒ තුළ ප්‍රධාන වශයෙන්ම 'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 26.5), 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 25.0), 'දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 21.4), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 18.4), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 12.3), 'යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය' (සියයට 8.1), ) සහ 'මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 1.9) වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් නිමැවුම් කර්මාන්ත කටයුතු ත්‍රිත්වයක් මෙම කාර්තුවේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර තිබීම කැපී පෙනේ. එහිදී 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' (සියයට 473.2), 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 4.3) සහ 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' (සියයට 3.2) ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. තවද 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සහ 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' පිළිවෙලින් සියයට 0.9 ක් සහ සියයට 3.8 ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 0.8 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර එහි දී 'මූල්‍ය සේවා' සියයට 18.8 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. තව ද වෘත්තීය සේවා (සියයට 9.3), තොරතුරු තාක්ෂණ සේවා (සියයට 8.5) වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත. එසේ ම 'විදුලි සංදේශ සේවා' (සියයට 4.4), 'සෞඛ්‍ය සේවා' (සියයට 2.6), 'දේපොළ වෙළඳාම් සහ නිවාස අයිතිය' (සියයට 2.5) සහ 'රක්ෂණ සේවා' (සියයට 1.3) වශයෙන් මෙම කාර්තුවේ දී පසුබෑසීම් වාර්තා කර ඇත. මේ අතර ප්‍රධාන සේවා ආර්ථික කටයුතු කිහිපයක්ම මෙම කාර්තුවේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. ඒවා අතර 'නවාතැන් හා ආහාර පාන සැපයීම' (සියයට 34.2), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්' (සියයට 6.2), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 5.4), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 3.2), 'අධ්‍යාපනය' (සියයට 3.0), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 1.3) සහ 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 0.3) කැපී පෙනේ.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 203.1ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 236.6 ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 16.5 කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2021=100) 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 167.2 ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 203.6 ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 21.5 කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු, 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 7.9 ක සෘණ වර්ධනය හා සසඳන විට සියයට 3.6 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 637,260 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 229,305 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 10.4 ක පමණ දායකත්වයක් ලබාදී ඇති අතර ස්ථාවර මිල ගණන් යටතේ එම දායකත්වය සියයට 8.8 කි.

රූපසටහන 02

**කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - දෙවන කාර්තුව 2023**




**මූලාශ්‍රය:**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

DCS

"ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 31.0 ක පසුබැසීමට සාපේක්ෂව 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 44.4 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්තට අයත් ප්‍රධාන ධාන්‍ය නිෂ්පාදනයන් වන බඩ ඉරිඟු, මුං, කව්පි, තල, රට කජු පිළිවෙලින්, සියයට 27.7, සියයට 92.9, සියයට 26.5, සියයට 56.2, සියයට 48.0 කින් ඉහළ ගොස් ඇත.

"වී වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2022 දෙවන කාර්තුව සමඟ සැසඳීමේ දී 2023 දෙවන කාර්තුවේ දී සියයට 19.8 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා එකතු කළ අගය ස්ථාවර (2015) මිල ගණන් යටතේ රුපියල් මිලියන 27,247 ක් ලෙස වාර්තා කර ඇත.

මෙම කාර්තුවේදී "එළවළු වගා කිරීම" ආර්ථික කටයුත්ත සඳහා අගය එකතු කිරීම මහ කන්නයේ වගා කාල සීමාවෙන් 2023 වර්ෂය සඳහා අදාල වන මාසයක සහ යල කන්නයේ වගා කාල සීමාවෙන් මාස දෙකක නිෂ්පාදනයෙන් සමන්විත වේ. මෙම නිෂ්පාදනය ඇස්තමේන්තු කර ඇත්තේ ප්‍රධාන වශයෙන් අස්වනු නෙළන ලද ප්‍රමාණයේ දත්ත සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භෝග පුරෝකථනයේ ප්‍රකාශිත අපේක්ෂිත අස්වැන්න පිළිබඳ ඇස්තමේන්තු මත රඳාපවතින තාවකාලික අගයන් භාවිතා කරමිනි. නවතම පුරෝකථන වාර්තාවලට අනුව සියලුම එළවළු වර්ගවල පාහේ අපේක්ෂිත අස්වැන්න වර්ධනයක් පෙන්නුම් කර ඇත. එබැවින් 2023 දෙවන කාර්තුවේදී එළවළු වගා කිරීම ආර්ථික කටයුත්තේ

ස්ථාවර මිල ගණන් යටතේ දළ එකතුකල අගය සියයට 6.9 ක ඉහළයාමක් වාර්තා කර ඇත. තවද මෙම කාර්තුවේදී නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ එළවළු උප දර්ශකයේ සැලකිය යුතු වැඩිවීමක් හඳුනාගෙන ඇත.

"තෙල් සහිත පලතුරු වගාව" යන ආර්ථික ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල් වගාව, තැඹිලි වගාව හා කටුපොල් වගාව යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර පොල් වගා කිරීම ඉන් ප්‍රධාන වේ. "තෙල් සහිත පලතුරු වගාව" යන උප ආර්ථික ක්‍රියාකාරකම 2023 වර්ෂයේ දෙවන කාර්තුව තුළදී ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 26,050 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.8 ක දායකත්වයක් ලබාදී ඇත. 2022 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී පොල් ගෙඩි නිෂ්පාදනය සියයට 10 කින් පමණ පහල ගොස් ඇත. තව ද මෙම කාර්තුව තුළ පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ සාමාන්‍ය මිල 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ වාර්තා වූ රුපියල් 59.5 සිට රුපියල් 70.2 දක්වා සියයට 18.1 කින් පමණ වැඩිවී ඇත. 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ දී කටුපොල් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. එමෙන්ම 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පොල් ගෙඩි අපනයනය සියයට 15.0 කින් පමණ වැඩි වී ඇති අතර තැඹිලි අපනයනය සියයට 6.4 ක වැඩිවීමක් වාර්තා කර ඇත. 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී "තෙල් සහිත පළතුරු වගා කිරීම" යන සමස්ත ආර්ථික කටයුත්ත සියයට 8.4 ක පසුබැස්මක් වාර්තා කර ඇත.

"තේ වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2022 දෙවන කාර්තුවේ දී සියයට 19.8 ක පසුබැස්මක් වාර්තා කර තිබූ අතර 2023 දෙවන කාර්තුවේ දී සියයට 7.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2022 දෙවන කාර්තුව හා සැසඳීමේ දී මෙම කාර්තුවේ දී "නිමි තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 7.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. කොළඹ වෙළඳපොළෙහි නිමි තේ කිලෝවක සාමාන්‍ය මිළ, 2022 දෙවන කාර්තුව හා සැසඳීමේ දී රු. 1,300.84 සිට රු. 1,069.84 දක්වා සියයට 17.8 ක පසුබැස්මක් වාර්තාවී වී ඇත. තේ නිෂ්පාදනය සඳහා සියයට 56.4 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 1.8 ක වර්ධනයක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

"රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 5.8 ක වර්ධනයක් ද රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 5.2 ක වර්ධනයක් ද 2023 දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත. 2022 දෙවන කාර්තුවේදී "රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය 14.0 ක පසුබැස්මක් හා රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 15.8 ක පසුබැස්මක් වාර්තාවී ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙවන කාර්තුවේ තොරතුරු වලට අනුව, සකස් කළ රබර් කිලෝග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිළ රු. 1,068.09 සිට රු. 573.24 දක්වා සියයට 46.3 කින් පසුබැස ඇත.

"අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙම සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 7,032 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.3 ක පසුබැස්මක් වාර්තා කර ඇත.

'සත්ත්ව නිෂ්පාදනය'යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 21,005 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.6 ක දායකත්වයක් ලබාදී ඇත. මෙම කාර්තුව තුළ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2022 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 0.6 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්වේ දත්ත වලට අනුව මෙම කාර්තුව තුළදී බිත්තර නිෂ්පාදනය සියයට 1.4 කින් හා කිරි නිෂ්පාදනය සියයට 4.4 කින් වැඩි වී ඇත. තවද මස් පිණිස කුකුළන් ඇති කිරීම යන ආර්ථික ක්‍රියාකාරකම සියයට 3.2 කින් අඩු වී ඇත. එමෙන්ම 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ දී මස් පිණිස ඇති කරන සියලුම සතුන්ගේ (ගවයන්, එළුවන්, ඌරන් සහ කුකුළන්) මිල, දියර කිරි ලීටරයක මිල, බිත්තර සඳහා මිල යන නිෂ්පාදකයාගේ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

"පැළ හා බීජ ප්‍රවර්ධනය" යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ රට තුළ පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස් හා පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරිමයි. 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ දී ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 234 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 19.5 ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කර ඇත.

වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමේ දී හා අස්වනු නෙලීමේ දී පිළිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට

ජනනය වන ආර්ථික විටිනාකම මෙහිදී සලකනු ලබයි. එය මෙම ආර්ථික කටයුත්තෙහි ප්‍රධාන සංරචකයි. ඊට අමතරව ධාන්‍ය වගා භෝග කිහිපයක් හා එලවළු භෝග කිහිපයක් සඳහා එලෙස පස සකස් කිරීමට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පිරිවැය ඔස්සේ ඒ සඳහා වන යාන්ත්‍රික සහායක සේවා සැපයුම මීට එකතු කරනු ලබයි. කෙසේ නමුත් 2023 දෙවෙනි කාර්තුවේ දී මෙම ආර්ථික කටයුත්ත සියයට 13.2 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර බඩ ඉරිඟු වගා බිම් ප්‍රමාණයේ විශාල ඉහළ යාමක් පුරෝකතනය කොට ඇති තත්ත්වය මෙම කාර්තුවේ මෙම වර්ධනයට මූලික හේතුව ලෙස සැලකිය හැකිය . (මෙම වර්ධනය සඳහා, සෙසු භෝගයන් වෙනුවෙන් මෙකී යන්ත්‍රෝපකරණ යෙදවුම් හි විශේෂ දායකත්වයක් පෙන්නුම් නොකරයි ) ඉන්ධන මිළ ඉහළ යාම හේතුවෙන් හා combined harvestor හි යාන්ත්‍රික යෙදවුම් වල මිළ ගණන් ඉහළ යාම නිසා මෙම සේවා ගාස්තු ඉහළ යාම පවත්නා මිළ ගනන් අනුව එකතු කල අගයෙහි ඉහළ යාමට හේතුවිය
.

"වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය" යන උප කෘෂිකාර්මික ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකමයි. රටේ පැවති ගෘහස්ථ ගෑස් අවශ්‍යතාව ක්‍රමයෙන් සාක්ෂාත් කරගැනීමත් මිළ මට්ටමේ අඩුවීමත් නිසා, පසුගිය අවුරුද්දේ සිවුවෙනි කාර්තුවේ සිට දර නිෂ්පාදන ඉල්ලුම ක්‍රම ක්‍රමයෙන් පහළ යාම නිසා දර නිෂ්පාදනය අඩු වීම (මෙම අවුරුද්දේ පලමු කාර්තුවේදී මෙන්) මෙවරත් නිරීක්ෂණය කළ හැක. කෙසේ නමුත්, පසුගිය වසරේ මෙම කාර්තුවේ මිළ ට සාපේක්ෂව දර මිල ඉහළ යාම නිසා වර්තන මිලට ඉහළ දායකත්වයක් ඇත. එමෙන්ම ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ පසුබැසීම නිසා දැව කඳන් නිෂ්පාදනය අඩු වීම නිරීක්ෂණය කළ හැක. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය අඩු වීම ද පෙන්නුම් කරන හෙයින් ඒ සඳහා වූ දැව කඳන් ඉල්ලුම අඩු වීම ද නිරීක්ෂණය කළ හැක. රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන් නිෂ්පාදනය මෙවර සියයට 12.8 කින් අඩු වී ඇත. ස්ථාවර මිළ යටතේ මෙම ආර්ථික කටයුත්තෙහි සැලකිය යුතු අඩු වීම මේ මට්ටමින් වුවත් පවත්නා මිළ මට්ටම් අනුව සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරයි.

2023 දෙවන කාර්තුවේ කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්තෙහි වර්තන මිළ අනුව එකතුකළ වටිනාකම රු.මිලියන 75,746 ක් වන අතර, එය දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.2 ක දායකත්වයක් දක්වයි. 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව, ස්ථාවර මිළ අනුව ,2023 දෙවන කාර්තුවේ කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්ත සියයට 1.3 ක වර්ධනයක් දක්නට ලැබේ. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ වාර්තා වලට අනුව 2023 දෙවන කාර්තුවේ දී, පෙර වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව කරදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 1.1 ක සුළු ඉහල යැමක් පෙන්වයි. 2023 දෙවන කාර්තුවේදී වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 20.0 ක ඉහල යැමක් පෙන්වන අතර ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය 16.0 ක පහල යැමක් පෙන්වයි. ධීවර අමාතංශයේ වාර්තා වලට අනුව 2023 දෙවන කාර්තුවේ මත්ස්‍ය නිෂ්පාදනය පහල යැම කෙරෙහි, ධීවර මෙහෙයුම් සඳහා වැයවන වියදම් ඉහල යැම හේතු වී තිබේ. විශේෂයෙන්ම ඉන්ධන මිළ ඉහළයාම ධීවර මෙහෙයුම් සීමා කිරීමට හේතු වී තිබේ.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ වාර්තා වලට අනුව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 දෙවන කාර්තුවේදී සියයට 14.0 ක පහල යැමක් දක්නට ලැබේ.

### 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2022 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 වසරේ දෙවන කාර්තුවේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 11.5 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 1,661,672 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 702,638 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිළ ගණන් යටතේ 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 27.0 ක පමණ දායකත්වයක් ලබාදී ඇති අතර ස්ථාවර මිළ ගණන් යටතේ එම දායකත්වය සියයට 27.1 කි.

රූපසටහන 03

**කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - දෙවන කාර්තුව 2023**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී “පතල් හා කැනීම්” කර්මාන්තය පවත්නා මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.5 ක දායකත්වයක් දක්වා ඇති අතර, පෙර වර්ෂයේ දෙවන කාර්තුව සමඟ සසඳන කල මෙම ආර්ථික කටයුත්ත සියයට 24.3 ක පසුබැසීමක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත “ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්”, “මැණික් කැනීම්” හා “අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම්” වශයෙන් කාණ්ඩ තුනක් යටතේ වෙන් වෙන්ව හඳුනාගත හැකි ය. සමස්ත පතල් හා කැනීම් ආර්ථික කටයුත්තේ දළ එකතුකළ වටිනාකමෙන් සියයට 86.3 ක පමණ ප්‍රමාණයක් “ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්” මගින් ලබාදෙයි. මෙම කාර්තුවේ දී “ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්” හා “ඛනිජ ද්‍රව්‍ය කැනීම්” පිළිවෙළින් සියයට 27.8 ක් හා සියයට 19.5 ක් ලෙස පසුබැසීම් වාර්තා කර ඇති අතර “මැණික් කැනීම්” සියයට 13.8 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ නමුත්, ඉහළ දායකත්වයක් සපයන “ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්” සම්බන්ධයෙන් වාර්තා වී ඇති සෘණ වර්ධනය සමස්තයක් වශයෙන් මෙම ආර්ථික කටයුත්තේ පසුබැසීමක් වාර්තා වීමට බලපා ඇත.

විදුලිය නිෂ්පාදනය” කර්මාන්තයෙහි ස්ථාවර මිල ගණන් යටතේ දළ එකතු කළ අගය 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 0.9 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. එහි දී විදුලිය නිෂ්පාදනය සමස්තයක් වශයෙන් සියයට 1.3 කින් වැඩිවීමක් වාර්තා කර ඇතත් එහි දී ජල විදුලිය නිෂ්පාදනය සහ පුනනර්ජනනීය විදුලිය නිෂ්පාදනය පිළිවෙලින් සියයට 27.0 ක් සහ සියයට 4.0 ක් වශයෙන් අඩුවී ඇත. ඒ අනුව ඉන්ධන යොදාගනිමින් තාප විදුලි බලාගාර මගින් සිදුකරන විදුලිය නිෂ්පාදනය සියයට 19.0 ක පමණ විශාල වැඩිවීමක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත. තාප විදුලි බලාගාර මගින් සිදුකරන විදුලිය නිෂ්පාදනයේ එකතුකළ අගය සාපේක්ෂව අඩු බැවින් ස්ථාවර මිල ගණන් යටතේ දළ එකතුකළ අගය මෙම කාර්තුවේ දී සියයට 0.9 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ 28:52:19 ක් ලෙස වාර්තා වු ජල විදුලිය, තාප විදුලිය සහ පුනර්ජනනීය විදුලිය සහ අතර අනුපාතය 21:61:19 ක් ලෙස වෙනස් වී ඇත.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී “ජලය එක්රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම” යන උප ආර්ථික කටයුත්ත සියයට 3.8 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් ජල ගාස්තු විශාල වශයෙන් වැඩිවීම පිළිඹිබු කරමින් පවත්නා මිල ගණන් යටතේ මෙම කටයුත්තේ දළ එකතුකළ අගය සියයට 23.5 ක ඉහළ යාමක් වාර්තා කර ඇත.

2022 දෙවන කාර්තුව හා සසඳන විට 2023 දෙවන කාර්තුවේදී 'ඉදිකිරීම්' ක්‍රියාකාරකම් සියයට 23.1 කින් අඩු වී ඇත. මෙම කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ඉදිකිරීම් කටයුතුවල කොටස සියයට 5.9 ක් ලෙස වාර්තා වී ඇත. එමෙන්ම 2023 දෙවන කාර්තුව තුළ සමස්ත සිමෙන්ති සැපයුම සියයට 16.1 කින් පහත වැටී ඇති අතර ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාමද මෙම සෘණ වර්ධනයට හේතු වී තිබේ.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්හි සියයට 5.3 ක හැකිලීමක් වාර්තා වී ඇති අතර තව දුරටත් 2023 වර්ෂයේ දෙවන කාර්තුවේදී සියයට 5.1 ක සැලකිය යුතු හැකිලීමක් වාර්තා විය. මෙම නිෂ්පාදන ක්‍රියාකාරකම්හි හැකිලීම්වලට මූලික වශයෙන් හේතු වූයේ නිෂ්පාදන කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ වත්මන් ආර්ථික පරිසරයයි. කෙසේ වෙතත්, නිෂ්පාදන ක්‍රියාකාරකම් පවත්නා මිල අනුව සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18.1 ක් වූ අතර එය පවත්නා මිල ගණන් අනුව රුපියල් මිලියන 1,113,502 ක් සහ ස්ථාවර (2015) මිල ගණන් යටතේ රු. මිලියන 424,137 ක් ලෙස වාර්තා වී ඇත.

නිෂ්පාදන කර්මාන්ත කටයුතු තුළ විශාලතම උප ක්‍රියාකාරකම්, එනම් 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සියයට 6.7 ක දායකත්වයක් ලබා දී ඇති ඇත. මෙම උප ක්‍රියාකාරකම්හි 2023 දෙවන කාර්තුවේදී සියයට 3.2 ක වර්ධන වේගයක් දක්නට ඇති නමුත් එය 2022 දෙවන කාර්තුවේදී සියයට 11.1 ක හැකිලීමක් වාර්තා කර ඇත.

දෙවන විශාලතම ක්‍රියාකාරකම් වන 'රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් සහ සම් නිෂ්පාදනය' 2023 දෙවන කාර්තුවේදී සියයට 18.4 ක හැකිලීමක් වාර්තා වී ඇති අතර එය 2022 එම කාර්තුවේ දී සියයට 27.9 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්ත කර්මාන්තය 2023 දෙවන කාර්තුවේදී සියයට 473.2 ක සැලකිය යුතු ඉහළ වර්ධන වේගයක් වාර්තා වී ඇති අතර 2022 දෙවන කාර්තුවේදී එය සියයට 77.8 ක හැකිලීමක් වාර්තා කර ඇත.

'රසායනික නිෂ්පාදන සහ මූලික ඖෂධ නිෂ්පාදනය' කර්මාන්තය 2022 දෙවන කාර්තුවේ සියයට 4.6 ක හැකිලීමක් වාර්තා වී ඇති අතර 2023 දෙවන කාර්තුවේ සියයට 4.3 ක වර්ධනයක් වාර්තා වී ඇත.

අනෙකුත් සියලුම නිෂ්පාදන කටයුතු පිළිබඳ සලකා බැලීමේදී, ඒවායින් බොහොමයක හැකිලීම් වාර්තා වී ඇත. මෙම කාර්තුව තුළ පහත සඳහන් නිෂ්පාදන ක්‍රියාකාරකම් හි කැපී පෙනෙන සංකෝචනයන් වාර්තා වී ඇත.: 'රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය' (සියයට 26.5), කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය ' (සියයට 25.0), දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදනය (සියයට 21.4), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 12.3), 'යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය' (සියයට 8.1), 'අනෙකුත් නිෂ්පාදන සහ අලුත්වැඩියා' (සියයට 4.1), 'මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදනය (සියයට 1.9), සහ 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 0.2).

## 1.3 සේවා ආර්ථික කටයුතු

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 0.8 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,490,632 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 1,541,492 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 56.8 ක පමණ දායකත්වයක් ලබාදී ඇති අතර ස්ථාවර මිල ගණන් යටතේ එම දායකත්වය සියයට 59.3 කි.

රූපසටහන 04
සේවා ආර්ථික කටයුතුවල වර්ධනය - දෙවන කාර්තුව 2023




**මූලාශ්‍රය:**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

DCS

“තොග සහ සිල්ලර වෙළඳාම” 2023 දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 13.8 ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2022 දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 2.1 ක වර්ධනය හා සැසඳීමේ දී 2023 දෙවන කාර්තුවේ දී සියයට 0.3 ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි.

“තොග හා සිල්ලර වෙළඳාම” යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාමට අමතරව ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, විද්‍යුත් උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම යනාදිය ආවරණය කරයි.

භාණ්ඩ ආනයන සහ තොග හා සිල්ලර වෙළෙන්දන් හරහා පාරිභෝගිකයන් අතට පත්වන දේශීය නිෂ්පාදිතයේ උච්චාවචනයන් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතු කෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2022 දෙවන කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 1,505,533 වූ අතර 2023 දෙවන කාර්තුව සඳහා එය රු. මිලියන 1,327,257 දක්වා සියයට 11.8 කින් අඩුවී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ පැවති රු. මිලියන 202,463 සිට රු. මිලියන 250,933 දක්වා සියයට 23.9 කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2022 දෙවන කාර්තුව හා සසඳන විට 2023 දෙවන කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 16.7 කින් ද, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 8.6 කින් ද වැඩිවී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2022 දෙවන කාර්තුව හා සසඳන විට 2023 දෙවන කාර්තුවේ දී ලෝකයේ සෙසු රටවල් වෙත යොමු වූ මුළු අපනයන වටිනාකම සියයට 21.5 කින් ඍණාත්මකව වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 7.2 කින් ඍණාත්මකව වර්ධනය වී තිබේ. එහි දී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සහ කාර්මික අපනයන පරිමා දර්ශකය මෙම කාර්තුවේ දී පිළිවෙලින් සියයට 4.6 කින් සහ සියයට 7.6 කින් ඍණාත්මකව වර්ධනය වී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන සේවා ආර්ථික කටයුත්ත, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික

කාර්යයන් ගෙන් සමන්විත වේ. 2023 දෙවන කාර්තුවේ දී ගොඩබිම් ප්‍රවාහන කටයුතු ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ දෙවන කාර්තුව ට සාපේක්ෂව, පොදු මගී ප්‍රවාහන සේවා හා භාණ්ඩ ප්‍රවාහන සේවා ධන වර්ධනයක් වාර්තා කිරීම මේ සඳහා බලපා ඇත. මේ අනුව ජාතික ගමනාගමන කොමිසම මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය සියයට 26.9 කින් වැඩි වී ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය පිළිවෙලින් සියයට 8.2, 13.1 ලෙස අඩු වී ඇත. මෙම කාර්තුවේ දී ගුවන් ප්‍රවාහනය ද ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ශ්‍රී ලංකා ගුවන් සමාගමේ මගී කිලෝ මීටර් සංඛ්‍යාව සියයට 11.1 කින් වර්ධනය වී ඇත. ගබඩා පහසුකම් සැපයීම සහ අනෙකුත් ප්‍රවාහන සහය සේවා කටයුතු ද ධන වර්ධනයක් වාර්තා කර ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් ප්‍රවාහන කටයුතු 2022 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 දෙවන කාර්තුවේ දී සියයට 5.4 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

තැපැල් හා කුරියර් සේවා" ආර්ථික කටයුත්ත සැලකීමේදී, 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 3.2 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ධන වර්ධනය සඳහා කුරියර් සේවා විශාල වශයෙන් දායක වී ඇත.

"නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම" යන ආර්ථික කටයුත්ත 2022 දෙවන කාර්තුවේ වාර්තා කල සියයට 33.9 ධන වර්ධනයට සාපේක්ෂව 2023 දෙවන කාර්තුවේදී දී සියයට 34.2 කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තා අනුව 2022 දෙවන කාර්තුවේදී දී විදේශීය සංචාරකයන් 126,043 පැමිණ තිබූ අතර එය 2023 දෙවන කාර්තුවේදී දී 289,195 ක් ලෙස වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙවන කාර්තුව තුළ කාර්තුමය පිරිවැටුම 2022 දෙවන කාර්තුවේ කාර්තුමය පිරිවැටුම හා සසඳන විට සියයට 52.7 කින් වැඩි වී ඇත.

වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම" යන සේවා ආර්ථික කටයුත්ත සියයට 6.2 ක වර්ධනයක් 2022 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ වාර්තා විය.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී "විදුලි සංදේශ" උප ආර්ථික කටයුත්ත සියයට 5.9 ක ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති නමුත් 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී. සියයට 4.4 හැකිලීමක් දැක ගත හැක. ඊට හේතුව, 2023 වර්ෂයේ සිට රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සියයට 19.4 කින් අඩු වී ඇති අතර ජංගම දුරකථන සම්බන්ධතා සියයට 5.3 කින් අඩු වී ඇත. තව ද අන්තර්ජාලය සහ ඊ - තැපෑල භාවිතා කරන සම්බන්ධතා ප්‍රමාණය 2023 වර්ෂයේ දී දෙවන කාර්තුවේ දී සියයට 1.0 කින් අඩු වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.9 ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු "පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්", 2022 දෙවන කාර්තුව හා සසඳන විට මෙම කාර්තුවේ දී සියයට 8.5 ක හැකිලීමක් වාර්තා කර ඇත. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස දක්ෂ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ සංක්‍රමණය ඉහළ වේගයකින් ඉහළ ගොස් ඇති අතර එය තොරතුරු තාක්ෂණ කර්මාන්තයට ද අහිතකර ලෙස බලපා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2022 දෙවන කාර්තුව හා සසඳන විට 2023 දෙවන කාර්තුව තුළ දී එක්සත් ජනපද ඩොලරයේ අගයෙන් පරිගණක සේවා අපනයන ආදායම ඩොලර් මිලියන 276 සිට ඩොලර් මිලියන 236 දක්වා සියයට 14.3 කින් අඩු වී ඇත.මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2022 දෙවන කාර්තුව හා සසඳන විට 2023 දෙවන කාර්තුවේ දී පරිගණක සේවාවලින් උපයන ලද අපනයන ආදායමේ වටිනාකම රු. මිලියන 95,496 සිට රු. මිලියන 73,474 දක්වා අඩු වී ඇත. මෙයට හේතුව මැත කාර්තු තුළ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාමයි.

''මූල්‍ය සේවා සැපයීම" ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්හි දත්ත උපයෝගී කර ගනී. මෙම ආර්ථික කටයුත්ත 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 දෙවන කාර්තුවේ සියයට 18.8 ක සෘණ වර්ධනයක් වාර්තා වේ. එම වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) සියයට 21.5 කින් ඉහල යෑමයි. මෙම කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ එකතුකළ අගය රුපියල් මිලියන 111,228 ක් වූ අතර එය 2022 දෙවන කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 137,026 ට වඩා අඩු අගයක් ගනී. මූල්‍ය සේවාවන්හි භාවිතාව, ණය සහ අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව 2023 දෙවන කාර්තුවේ දී ණය අත්තිකාරම් වටිනාකම සියයට 10.1 කින් සෘණව වර්ධනය වී ඇති අතර මුළු තැන්පතු වටිනාකම සියයට 5.6 කින් වර්ධනය වී ඇත. 2023 දෙවන කාර්තුවේ "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය" සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය" පිලිවෙලින් සියයට 17.5 ක් සහ සියයට 15.1 ක් ලෙස සටහන් විය.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මූර්ත එකතුකළ අගය 2023 දෙවන කාර්තුවේ දී සියයට 1.3 ක පසුබෑස්මක් වාර්තා කර ඇති අතර 2022 දෙවන කාර්තුවේ දී සියයට 45.9 ක

පසුබැස්මක් වාර්තා කර ඇත. රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම හා උපයන ලද හිමිකම් වටිනාකමෙහි එකතුව මෙම කාර්තුවේ දී සියයට 16.3 කින් වර්ධනය වී ඇත. මේ සමඟ මෙම කාර්තුවේදී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) අගය සියයට 21.5 කින් වර්ධනයවී ඇත.

"දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 2.5 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතුකළ අගය රුපියල් මිලියන 118,121 ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.3 ක දායකත්වයක් මෙම ආර්ථික කටයුත්ත මගින් ලැබේ.

වෘත්තීය සේවා 2022 දෙවන  කාර්තුවට සාපේක්ෂව 2023 දෙවන කාර්තුවේ දී සියයට 9.3 ක පහළ යාමක් වාර්තා කොට ඇත. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්", "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන් සහ ප්‍රකාශන කාර්යයන්", "පශු වෛද්‍ය කාර්යයන්", "කුලී හා බදු කාර්යයන්", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගිලි හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ. මෙම කාර්තුව තුලදී මෙම ආර්ථික කටයුතු නිමැවුම් අගය ගණනය කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන වැට් දත්ත වලට අනුව වේ.

2023 දෙවන කාර්තුවේ දී මානව සෞඛ්‍ය සේවා අංශය යම් පසුබැසීමක් වාර්තා කර ඇත. මෙම අංශය දෙවන කාර්තුවේ දී සියයට 2.6 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කල අතර, එය පෙර වසරේ එම කාලයට සාපේක්ෂව ආර්ථික ක්‍රියාකාරකම්වල හැකිලීමක් පෙන්නුම් කරයි. සෞඛ්‍ය සේවා අංශයේ මෙම පහත වැටීම සැලකීමේ දී කර්මාන්තය මුහුණ දෙන අභියෝග සහ බාධාවන් පිළිබිඹු කරයි. සෞඛ්‍ය පහසුකම්, රෝහල්, සායන, ඖෂධ සහ ඒ ආශ්‍රිත සේවාවන් ඇතුළත් වන මෙම අංශය තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ අඩුවීම මෙම සෘණ වර්ධන වේගයට හේතු වී ඇත. 'කොළඹ කොටස් වෙළඳපොලේ' ලියාපදිංචි කර ඇති දිවයිනේ ප්‍රධාන රෝහල් හයක ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන්ගේ දෙවන කාර්තුවේ (අප්‍රේල් සිට ජූනි දක්වා) දත්ත වලට අනුව, එම රෝහල්වල කාර්තුමය පිරිවැටුම 2022 වසරේ දෙවන කාර්තුවේ මූල්‍ය ප්‍රකාශන (අප්‍රේල් සිට ජූනි දක්වා) දත්ත හා සසඳන විට සියයට 23.9 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම, මෙම කාර්තුව තුළදී ඒ වැනලින් සේවාවන් සියයට 47.0 ක  වැඩි වීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුව තුළ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සෞඛ්‍ය උප දර්ශකයට අනුව එහි දර්ශක අගය 185.1 සිට 252.5 දක්වා සියයට 36.4 කින් ඉහළ ගොස් ඇත. එය 2022 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2023 වර්ෂයේ දෙවන කාර්තුවෙහි සෞඛ්‍ය අංශයේ මිල මට්ටම්වල තියුණු වැඩිවීමක් පෙන්නුම් කරයි.

වර්තන මිල අනුව මුළු දළ දේශීය නිෂ්පාදිතයට සියයට 5.2 ක දායකත්වයක් සපයන "අනෙකුත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම්", "කලා සහ පොදු විනෝදාස්වාදය", "වෙනත් පුද්ගලික ක්‍රියාකාරකම්" සහ "  සේවායෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. 2022 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දි භාණ්ඩ මිල ඉහල යාම නිසා මෙම සේවාවන් ලබාගැනීමට පැමිණෙන පුද්ගලයින් ප්‍රමාණය සීමාවීම වැනි හේතුන් නිසා වාර්තා වන්නේ සියයට 1.3 ක් වැනි සුළු වර්ධනයකි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+9411 2147071
+94 112877938